# ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටලුව සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

එන්.පි.ටි.සී. අමරසිංහ, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
amarasinghethakshila@gmail.com

කේ.ටි.ජී.ආර්. සමරසිංහ, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
nimesala04@gmail.com

ජේ.එන්.එන්.කුමාරි, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
apsararukmali5@gmail

**සංක්ෂේපය**

මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ දී රටක ශ්‍රම හමුදාව උපරිම වශයෙන් දායක කරවීමේ මූලික ස්ථම්භනය වන්නේ අධ්‍යාපනය යි. මානව සම්පතක් ලෙස බාහිර ලෝකයට පිවිසීමට මූලිකවම හැඩ ගස්වන්නේ පාසල් අධ්‍යාපනයයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රම කොතෙක් දුරට සේවා වියුක්ති ගැටලුවට බලපෑමක් ඇති කරන්නේ ද යන්න මෙහි දී විමසා බලයි. අධ්‍යාපනය රැකියාව සඳහා ද රැකියාව අධ්‍යාපනය සඳහා ද යන්න තෝරා බේරා නොගෙන ඉන් ජනිතවන සේවා වියුක්ති ගැටලුවට නිසි විසඳුම් සෙවීම අතාර්කික ය. මේ නිසා ලාංකේය ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ අපි කවරක් අරමුණු කොට ගෙන කුමක් උගන්නමු ද යන ගැටලුවට විසඳුම් සෙවීමට තවමත් අපොහොසත් වී ඇත. ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය ඉහළ අගයක් ගනු ලබන්නේ සාපේක්ෂ වශයෙන් ඉහළ අධ්‍යාපන මට්ටමක් ලැබූ පිරිස් අතර ය. එයට මූලික හේතුව වී ඇත්තේ සේවා වියුක්තිය පහළ මට්ටමක රඳවා ගැනීමට පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් තවමත් සංවේදී ලෙස පොදු ආර්ථිකය සඳහා හඳුන්වා දීමට රාජ්‍යය ප්‍රතිපත්ති ඍජු වශයෙන් දායක වී නොමැති වීමයි. විශේෂයෙන් ම අප රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රටේ සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍යය ශිල්පීය කුසලතා, නිමවුම් හැකියාවන් හා දැනුම සම්පූර්ණ වශයෙන් ලබා දීමට තරම් පොහොසත් වී නැත. මේ නිසා සේවා වියුක්තිය අධ්‍යාපනය ලැබූ පිරිස් අතර වැඩි වශයෙන් දක්නට ලැබෙන නිසා එය විසඳා ගැනීමට ඵලදායී අධ්‍යාපන ප්‍රතිපත්තිමය විසඳුම්වල අවශ්‍යතාවයේ වැදගත්කම මෙහි දී සාකච්ඡා කරනු ලබයි.

**මූඛ්‍ය පද** : සේවා වියුක්තිය, අධ්‍යාපනය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

## හැඳින්වීම

ආර්ථික, සමාජ, දේශපාලන වශයෙන් සංවර්ධනාත්මක ප්‍රගතියක් අත්පත් කර ගැනිමට හැකිවන පරිදි ශ්‍රම හමුදාව හැඩ ගස්වා ගැනීමේ දරන ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනය නැමැති සංවර්ධනාත්මක විෂය ක්ෂේත්‍රය ආර්ථික විද්‍යා විෂයය ක්ෂේත්‍රයට එකතු විය. ආර්ථිකයක වර්ධනය හා සංවර්ධනය ඇති කිරීමට මූලික වශයෙන් දායක වන්නේ මානව ප්‍රාග්ධනය වන අතර මානව ප්‍රාග්ධනය සැපයීමේ සේවා දායකයා වන්නේ රටක අධ්‍යාපනය යි. රටක් සංවර්ධනය කිරීමට ස්වභාවික සම්පත් පමණක් ප්‍රමාණවත් නොවන බව අපි දනිමු. ස්වභාවික සම්පත් පැවතියත් ඒවා හොඳින් කළමනාකරණය කිරීමට හොඳ මානව සම්පතක් තිබිම අත්‍යවශ්‍යය වේ. එනම්,

නෛසර්ගිකව අධ්‍යාපනය ලබා දීම රටකට හොඳ මානව සම්පතක් ගොඩ නඟා ගැනීමට ඉවහල් වුවත් වඩාත් උචිත වන්නේ හොඳ මානව සම්පතක් යන්න අධ්‍යයනයේ අරමුණ ලෙස ගැනීමයි. ඒ සඳහා ආර්ථිකමය පදනම සකසනු ලබන්නේ අධ්‍යාපනය යි. මේ නිසා ආර්ථිකයට දායක වන ආකාරයට මානව සම්පත සකසා ගැනීමේ ක්‍රමයක් ලෙස ගෙන අධ්‍යාපනය සාකච්ඡා කිරීම වටී.

ප්ල්ටෝ සිය අධ්‍යාපන දර්ශනයට අනුව පෙන්වා දෙන්නේ රටක ආර්ථික ව්‍යුහය යනු ධනය නිෂ්පාදනය, ධනය බෙදීයාම හා දේපොළ අයිතිය වන බවයි. ධනය උපදවීමේ මූලික අයිතිය හා වගකීම පැවරෙන්නේ ඇතන්ස් පෞර රාජ්‍යයේ ශිල්පීන්ට හා කෘෂි කාර්මිකයන්ටයි. මෙම ශිල්පීන් බිහි කිරීමේ කාර්යය එරට පැවති අධ්‍යාපන නිකේතනවලට පැවරී තිබුණි (වීරසිංහ, 1998). රූසෝ පෙන්වා දෙන පරිදි අධ්‍යාපන ක්‍රියාවලියක ඇතුළත් විය යුතු ප්‍රධාන විෂය ළමයාට මනාව ජීවත් වීම සඳහා මඟ පෙන්වන බවයි. හොඳ පුරවැසියෙකු ලෙස කෙනෙකුට සමාජයේ ජීවත් විය හැක්කේ ශක්තිමත් ආර්ථික පසුබිමක් මඟින් ද එකී පසුබිම ජනිත කරනුයේ අධ්‍යාපනය හරහා බව පෙන්වා දුන්නේ ය. වර්තමානය වන විට ආර්ථික විද්වතුන් හා ජාත්‍යන්තර සංවිධාන විසින් අධ්‍යාපන පරමාර්ථ දක්වමින් විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. ඒ අතර 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව අධ්‍යාපනයේ පරමාර්ථ ලෙස ජාතික අරමුණු 09 ක් හා පොදු අරමුණු 05 ක් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අතරින්,

1. ජාතියේ සමාජීයය හා ආර්ථික සංවර්ධනයට රුකුලක් වන මානව සම්පත් සංවර්ධනය සඳහා සියල්ලන්ටම සහභාගී විය හැකි විවිධ අධ්‍යයන අවස්ථා සැලසීමත්

2. උදාර වූ හැඟීමක් ආත්මතෘප්තියක් ගෙන දෙන්නා වූ රැකියා අවස්ථා සැපයීම මේ අතරින් ප්‍රමුඛස්ථානයක් ගනී.

මේ අනුව පෙනී යන්නේ සැලසුම් සම්පාදනයේ අධ්‍යාපනය හා ආර්ථිකය යන සංකල්ප අතර අන්‍යොන්‍ය සබඳතාවක් ඇති බවයි. මුල් කාලීන ආර්ථික සංවර්ධන සැළසුම් බොහොමයක් ඉලක්ක වූයේ සමාජ සංවර්ධනය අත්පත් කර ගැනීම උදෙසා ය. අධ්‍යාපනයේ මූලික කාර්යභාරය වන මානව සම්පත් සංවර්ධනය ආර්ථික සංවර්ධනයක් උදෙසා ආයාත කර ගන්නා ආකාරයත් ඒ සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනයටත් අවකාශය සළසා ගැනීම වර්තමානයේ ප්‍රමුඛතාව ලබා දීම සිදු කළ යුත්තකි.

### අධ්‍යාපනයේ විවිධ අංශ

ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රය විවිධ අංශයන්ගෙන් හා මට්ටම්වලින් සමන්විත සංවිධාන ව්‍යුහගතයන් සැකසී ඇත. එහිලා ප්‍රධාන මාධ්‍යයන් තුනක් ඇත.

1. විධිමත් අධ්‍යාපනය
2. අවිධිමත් අධ්‍යාපනය
3. නොවිධිමත් අධ්‍යාපනය

අප මෙහි දී සාකච්ඡා කරනු ලබන්නේ විධිමත් අධ්‍යාපනය හා සේවා වියුක්තිය අතර පවතින සම්බන්ධතාවය යි. ඉතා සරලව දක්වුවහොත් විධිමත් අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ සංවිධාත්මක නිශ්චිත පරමාර්ථ හා අරමුණ මත පිහිටා ආයතනගත

ස්වරූපයෙන් දෙනු ලබන අධ්‍යාපනය යි. අප දන්නා පරිදි විධිමත් අධ්‍යාපනය ප්‍රවිෂ්ට වීම මූලිකව සිදු වන්නේ පාසල හරහායි. නිවසේ පරිසරයට අනුගත වී හැදී වැඩෙන ළමයා සංවිධානාත්මක මානව සම්පතක් ලෙස හැඩ ගස්වා ගනු ලබන්නේ පාසලයි. එතැන් සිට ලබන ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම විශ්වවිද්‍යාල අධ්‍යාපන මට්ටම දක්වා ක්‍රමවත් විෂය මාලාවකට අනුගතව ලබන අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනය වශයෙන් ලබා දෙයි.

ෆෙඩ්රික් හාබිසන් විධිමත් අධ්‍යාපනය හඳුන්වා ඇත්තේ පූර්වකාලීන පන්ති කාමර පැමිණීම සහිත, වයස් මට්ටම් අනුව ශ්‍රේණිගත කරන ලද සහතික - ඩිප්ලෝමා උපාධි යනාදිය ලබා ගැනීම කෙරෙහි යොමු වූ අධ්‍යාපන ක්‍රමයක් ලෙසට යි. අධ්‍යාපනයේ පවතින අධික ශාස්ත්‍රීය නැඹුරුවත් අනම්‍ය ස්වරූපයෙන් ප්‍රායෝගික දැනුම් සම්භාරයකින් උපලක්ෂිත වීම නිසා විවිධ සංකුලතා මතු වන්නට විය. විධිමත් අධ්‍යාපනයේ බලකණුව වශයෙන් සලකන පාසල් අධ්‍යාපනයේ සැකැස්ම කොතරම් දුරට රටක සේවා වියුක්ති ප්‍රශ්නය කෙරෙහි බල පැවැත්වන්නේ දැයි විමසීම වටී. විධිමත් පාසල් අධ්‍යාපනය මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ දී වැදගත් කොට සලකන්නේ එහි ළමයා තුළ ගොඩ නඟන විෂය දැනුම, කුසලතා වර්ධනය, ආකල්ප, නිර්මාණාත්මක ශක්තිය, විනය ආදී පුද්ගල පෞරුෂය ගොඩ නගන සකල විධ ගුණයන් මූලිකවම උගන්වන කේන්ද්‍රස්ථානයක් වන බැවිනි. භෞතික, ආර්ථික, දේශපාලනික පසුබිම අනුව විධිමත් අධ්‍යාපනය රටකින් රටකට වෙනස් විය හැකි ය.

සමස්තයක් වශයෙන් බලන විට පෙනී යන්නේ රටක පාසල් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම දැවැන්ත, තීරණාත්මක භාරදූර කර්තව්‍යක් බවයි. පාසලට දරුවෙකු ඇතුළත් කිරීමේ මූලික පරමාර්ථය විය යුත්තේ පරිසරයට හැඩ ගැස්විය හැකි මනසක් හෙබි දැනුමෙන් හා හැකියාවෙන් පොහොසත් අයෙකු බවට පත් කිරීමයි. එය රටකට අවැසි වන යථාර්ථවාදී මානව ප්‍රාග්ධනය යි. මේ නිසා පාසල් විෂය මාලාවට අන්තර්ගත කරන සෑම විෂයක්ම සමාජයේ උන්නතිය උදෙසා විවර කරන දෙයක් බවට පත් විය යුතු ය. අප රටේ වාර්ෂික අයවැය ලේඛනයෙන් වැඩි වැය ප්‍රමාණයක් වැය කරන්නේ විධිමත් අධ්‍යාපනය උදෙසා යි. එනිසා ඉන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය කළ යුතු වේ. අධ්‍යාපනයට දරන වියදම් ප්‍රමාණය වැඩි කිරීමත් සමඟ අධ්‍යාපන සැළසුම් මනාව ආසක්ත නොවුනහොත් එහි දිගුකාලීන ප්‍රතිඵලය වන්නේ විශාල සේවා වියුක්තියක් ජනිත වීම යි.

අධ්‍යාපනය රටක දිගුකාලීන හා ආර්ථික වර්ධනය සඳහා භෞතික ප්‍රාග්ධනය හා සමාන වැදගත්කමක් මානව ප්‍රාග්ධනයට හා ඒ සඳහා කරනු ලබන ආයෝජනයට හිමි වේ. මේ නිසා මිනිස්සුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට ඔවුන්ගේ රැකියා අවස්ථාවක් සඳහා යොමුකිරීමට අපේක්ෂාකරන රජයකට අනුගමනය කළ හැකි වැදගත් ම ප්‍රතිපත්තිය වනුයේ එරටෙහි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ඉහළ අවධානයක් ලබා දී ඒවායේ ගුණාත්මකභාවය වැඩ ලෝකයට සරිලන ලෙස හැඩගස්වා ගැනීමට යොමු කිරීමයි. ඉන් ඇතිවන ධන බාහිරතා කරණ කොටගෙන මානව ප්‍රාග්ධනය ඉහළ සේවා නියුක්තියක් ජනිත කරමින් ආර්ථික වෘද්ධිය කෙරෙහි වඩාත් ප්‍රබල දායකත්වයක් සපයනු ලබයි.

ශ්‍රම ඵලදාව තීරණය කරන ප්‍රධාන සාධක කිහිපයක් හඳුනාගත හැකිය. එනම් භෞතික ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය, සමාජ ප්‍රාග්ධනය, තාක්ෂණික දැනුම, ශ්‍රම විභජනය ආකල්ප සහ ප්‍රතිමාන වශයෙනි. මෙහිදී අධ්‍යාපනය මගින් සිදු

කරන්නේ රටක මානව ප්‍රාග්ධනයේ ඵලදායිතාවය ඉහළ නැංවීමය. මානව ප්‍රාග්ධන තොගය රටක ශක්තිමත් වන විට ශ්‍රම ඵලදායිතාව ද පැහැදිලිව ම ඉහළ නගී. මානව ප්‍රාග්ධනය යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රම හමුදාව විසින් සමුච්චනය කරනු ලැබූ දැනුම කුසලතා සහ අත්දැකීම් සමුහය යි. අධ්‍යාපනය තුළින් ශ්‍රමිකයන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමේ ක්‍රියාවලිය හැඳින්වීමට ආර්ථික විද්‍යාවේ "මානව ප්‍රාග්ධනය" භාවිතා කරයි.

රටක ආර්ථිකයේ සෑම අංශයක ම ඵලදායීතාව ඉහළ නැංවීමට යාමේ දී ආර්ථිකයක වර්තමාන හා අනාගත ශ්‍රම හමුදාව හැඩගස්වා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවකි. ඒ සඳහා ගත හැකි එක් පියවරක් වනුයේ වර්තමාන සහ අනාගත ශ්‍රම හමුදාවේ අධ්‍යාපන මට්ටම හා සුදුසුකම් ඉහළ නැංවීම ය. මෙම ක්‍රියාවලිය "මානව ප්‍රාග්ධන සමුච්චනය කිරීම" ලෙස හඳුන්වයි. විධිමත් පාසල් අධ්‍යාපනය තුළින් මානව ප්‍රාග්ධනය ගොඩනැංවිය හැක. ඒ සඳහා විධිමත් ලෙස ගොඩ නංවන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ගේ අවශ්‍යතාව රටක ශ්‍රමයේ ඵලදායිතාව නැංවීමේ තීරණාත්මක සාධකයක් වේ. මේ සියලුදේ ම අවසාන ඉලක්කය වන්නේ රටක ශ්‍රම බලකාය උසස් මට්ටමකින් යුක්තව හැඩ ගස්සවා ගැනීමයි.

**සේවා වියුක්තිය**

සේවා වියුක්තිය යනු ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් කිසියම් ආර්ථික කටයුත්තකට ශ්‍රමය සැපයීමට කැමැති එහෙත් ඒ සඳහා අවස්ථාවක් නොලැබ ඇති පුද්ගලයන් ලෙස හඳුනා ගැනේ. කෙසේ නමුත් විවිධ පුද්ගලයන් ආයතන විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. එනම්, අදාල කාල පරිච්ඡේදය තුළ වැටුපකට, වේතනයකට ලාභයකට හෝ පවුලේ ආදායම වැඩි කිරීමකට කිසියම් රැකියාවක් සොයමින් සිටින හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින එහෙත් රැකියාවක් නොමැති පුද්ලයකු වශයෙනි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). ගත වූ සතිය තුළ රැකියාවක් නොමැතිව සිටින අය හා රැකියාවක් සොයමින් සිටින අය හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටි අය මෙන් ම එවැනි පුද්ගලයන්ට එම සතිය තුළ රැකියාවක් කිරීමට හැකියාවන්ද තිබිණි නම් එවැනි පුද්ගලයන් විරැකියා වෙන් පෙළෙන පුද්ගලයන් ලෙස හඳුන්වනු ලැබේ.

ගත වූ සතිය තුළ අඩුම වශයෙන් පැයක්වත් ශ්‍රමය සැපයීමට නොහැකි වූ පුද්ගලයන් විරැකියාවෙන් යුතු පුද්ගලයන් ලෙස හැඳින්වේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2013). මෙය අනිච්ඡානුගත සේවා වියුක්තියකි. එනම් රැකියාවක් කිරිමට කැමැත්තෙන් සිටියත් ඒ සඳහා අවස්ථාවක් නොමැති තත්ත්වය යි. එයට විරුද්ධ පැතිකඩනම් තම කැමැත්තෙන්ම රැකියාවක් නොකොට සිටීම එනම්, ඉච්ඡානුගත සේවා වියුක්ති තත්ත්වය වේ. මෙහි දී ඉච්ඡානුගත සේවා වියුක්තියට පත්ව ඇති පුද්ගයන් ශ්‍රම බලකායට ඇතුළත් නොවේ. විරැකියාවේ ප්‍රධාන ප්‍රභේද හතරක් හඳුනා ගත හැකි ය. එනම්, වාරික සේවා වියුක්තිය, ඝාර්ෂික සේවා වියුක්තිය, ව්‍යූහමය සේවා වියුක්තිය හා චක්‍රීය සේවා වියුක්තිය යි.

වාරික සේවා වියුක්තිය කෙරෙහි වාරිකත්වය විශාල ලෙස බලපායි. අවුරුද්දේ එක් එක් කාලවල දී ආර්ථික ක්‍රියාකාරකම් බහුල වෙන අවස්ථා ඇත. එවිට සේවා නියුක්තිය පහළ යයි. ආර්ථික ක්‍රියාකාරකම් අඩුවන අවස්ථාවල දී ශ්‍රමයේ ඉල්ලුම අඩු වී විරැකියා තත්ත්වයක් පැන නගී. වාරිකත්වයම සිදුවන කෘෂිකාර්මික කටයුතු, සංචාරක ව්‍යාපාරය,

වාර්ෂික උත්සව පැවැත්වෙන අවස්ථා යනාදිය මෙවැනි ආර්ථික කටයුතුවලට උදාහරණ වේ.

සාර්ෂික සේවා වියුක්තිය, ගතික හා විවෘත ආර්ථිකයක් තුළ මේ තත්වය ඉතා සාමාන්‍යය තත්වයකි. පුද්ගලයකු තමා කරමින් සිටින රැකියාවෙන් ඉවත් වි ඊට වඩා ආකර්ෂණිය වෙනත් රැකියාවක් කරා ඉවත් වී යාමේ අපේක්ෂාවෙන් කෙටි කාලයක් රැකියාවක් සොයමින් කාලය ගත කරනු ලැබේ. මෙය සාර්ෂික සේවා වියුක්තිය හෙවත් රැකියා සෙවීමේ විරැකියා තත්වය ලෙස ද හැඳින්වේ.

ව්‍යුහමය රැකියා තත්වය තාක්ෂණයේ හටගන්නා ප්‍රබල වෙනස්කම් හෝ කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම සදාකාලිකව ම ඉවත්ව යාම නිසා හෝ ශ්‍රම වෙළඳපොලේ ඇතිවිය හැකි විරැකියා තත්වය යි. උදාහරණ වශයෙන් පරිගණකයක් පැමිණිම නිසා පරිගණක භාවිතා කිරීමට නිපුණතා නොමැති පුද්ගලයන්ට රැකියා නොලැබෙනු ඇත. මෙය ව්‍යුහමය  විරැකියා තත්වයක් වන අතර, මෙම විරැකියා තත්ත්වය ඉක්මනින් ම ඉවත්ව නොයයි. ශ්‍රමිකයන් ඒ සඳහා පුරුදු පුහුණු කිරීම සඳහා ද විශාල මුදලක් මෙන් ම කාලයක් ද කැප කළ යුතු ය.

චක්‍රීය සේවා වියුක්තිය යනු ව්‍යාපාර චක්‍රයේ දෝලනයත් සමඟ හට ගන්නා සේවා වියුක්ත තත්වය යි. ආර්ථික පසුබෑමක් හෙවත් ප්‍රතිමානයක් හට ගන්නා අවස්ථාවල දී සේවා වියුක්ත තත්ත්වය ඉහළ නගී. විරැකියා අනුපාතිකය යන්නෙන් අදහස් කරන්නේ සේවා වියුක්ත ජන සංඛ්‍යාව ශ්‍රම හමුදාවේ අනුපාතයක් වශයෙන් පැවැතීම යි.

සැඟවුණු සේවා වියුක්තිය කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් ප්‍රශස්ථ අන්දමින් සිදුකිරීම සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් සංඛ්‍යාවට වඩා විශාල ශ්‍රමිකයන් ප්‍රමාණයක් සේවා නියුක්ත කර තිබේ නම්, එහි දී සැඟවුණ සේවා වියුක්තියක් පවතින බව හදුනාගත හැකි ය. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් ශ්‍රමිකයන් සේවා නියුක්ත කර තිබේ නම් ශ්‍රමිකයන්ගේ ආන්තික ඵලදායිතාව ද ඉතා පහළ අගයක් ගනු ලැබේ. දේශීය කෘෂි කාර්මික අංශය රාජ්‍යය ව්‍යවසාය වැනි ක්ෂේත්‍රවල මෙම ලක්ෂණය බොහෝ විට දක්නට ලැබේ. ශ්‍රමිකයන් සේවා නියුක්තිකයන් ලෙස මතුපිටින් පෙනී ගියත් සැබෑ වශයෙන් ගත් කල අතිරේක ශ්‍රමිකයන් නිෂ්පාදනය සඳහා ලබා දෙන දායකත්වය ශුන්‍යයවේ. විරැකියා අනුපාතිකය ගණනය කරන්නේ,

$$\text{විරැකියා අනුපාතිකය} = \frac{\text{සේවාවියුක්ත ජනසංඛ්‍යාව}}{\text{ශ්‍රමබලකාය}}$$

ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය සාපේක්ෂ වශයෙන් ඉතා පහළ මට්මක පවතී. තත්ත්වය එසේ වුවද අධ්‍යාපන ඉහළ මට්ටමක් ලැබූවා වූ තරුණ පිරිස් හා ස්ත්‍රී යන කොටස් වල විරැකියා අනුපාතිකය සාපේක්ෂ වශයෙන් ඉතා ඉහළ අනුපාතයකින් පවතී. සේවා වියුක්ති පිරිසෙයින් අඩකට වඩා අඩු පිරිසක් අ.පො.ස (සා.පෙළ) හෝ (උ.පෙළ) හෝ ඊට වඩා වැඩි අධ්‍යාපන මට්ටමක් ලබාගෙන ඇත. උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය ද මේ දක්වා සාර්ථකව නොවිසඳුනු ගැටලුවක් වේ. රැකියාවක් සොයා ගැනිම සඳහා දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවීම ද මේ දක්වා සාර්ථකව නොවිසුදුනු ගැටලුවක් වේ. සේවා වියුක්ත ජනගහණයෙන් 70% පමණ පිරිසක් රැකියාවක් නොමැතිව වර්ෂයකට

වඩා වැඩි කාලයක් බලා සිටීමට සිදුව ඇත. ස්ත්‍රීන්ගේ ගේ විරැකියා තත්වය පුරුෂයින් ගේ විරැකියා තත්වයට මෙන් දෙගුණයකි (Labour Force survey, 2012). ඒ සඳහා පහත කරුණු බලපානු ලැබේ.

1. සංවර්ධනය අඩු ප්‍රදේශවල ගැහැණුන් සඳහා යෝග්‍යය රැකියා අවස්ථා ප්‍රමාණවත්ව වර්ධනය වී නොතිබීම විශේෂයෙන්ම ග්‍රාමීය අංශයේ උගත් ගැහැණුන් හට රැකි රක්ෂා අවස්ථා ජනනය වන්නේ ඉතා සීමිත වශයෙනි.

2. කුඩා දරුවන් සිටින කාන්තාවන් හට දීර්ඝ කාලයකට ළමුන්ගෙන් බැහැර වී වෙනත් ප්‍රදේශයක රැකියාවක් යෙදවීම අපහසුවීම.

3. කාන්තාවන් අපේක්ෂා කරන ආකාරයේ රැකියා අවස්ථා බිහි වනු ඇත. උදාහරණ වශයෙන් අර්ධ කාලීන රැකියා, නම්‍යයශිලී, කාලවේලා සහිත රැකියා යනාදිය සොයා ගැනීම දුෂ්කර වීම.

4. උගත් කාන්තාවන් පෞද්ගලික අංශයේ හෝ නොවිධිමත් අංශයේ පවත්නා රැකියාවල නියුක්ත වීමට අකමැත්තක් දැක්වීම.

ද්විතියික හා තෘතියික අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි පිරිමි ළමුන්ට සාපේක්ෂව ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය 100% ඉක්මවා තිබුණ ද ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබාගත් තත්වය සඳහා රැකියා අවස්ථා බිහිව ඇත්තේ ඉතා මඳ වශයෙනි. මෙරට ජනගහන වර්ධනයට සාපේක්ෂව සේවා වියුක්ත අනුපාතය අඩු වන්නේ අඩු වේගයකින් බව පෙනී යයි. ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනය ලබන පිරිස නිසි පරිදි සේවා නියුක්ත කරවීමේ ගැටලුවක් ඇති බව ගම්‍යයමාන වේ. අධ්‍යාපනය ලබන මට්ටම ඉහළ යාමත් සමඟ ඉන් ගොඩ නැගෙන ගුණාත්මක මානව ප්‍රාග්ධනය අවශෝෂණය කර ගැනීමට නොහැකි වී ඇත. පහළම අධ්‍යාපනය ලැබුවන් හා ඉහළ ම අධ්‍යාපනය ලැබූවන්ට සේවා නියුක්ති ප්‍රශ්නය පිළිබඳ එතරම්ම ගැටලුවක් වී නැත.

ලංකාවේ අ.පො.ස (සා.පෙළ) විභාගයට ලක්ෂ 5 ට අධික ළමුන් පිරිසක් පෙනී සිට ඉන් සමත් වන්නේ 25% තරම් පිරිසකි. විශ්ව විද්‍යාල ප්‍රවේශය හිමි වනුයේ උසස් පෙළ සමත් 50% පිරිසකගෙන් 4% තරම් පිරිසකට ය. මේ අනුව මෙරට පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අරමුණු කර ගන්නා ඉලක්කයන් සේවා වියුක්ති ප්‍රශ්නයට විසඳුම් සෙවීමට තරම් ප්‍රමාණවත් නොවන බව පැහැදිලි ය. මෙහි ප්‍රතිඵලය නම් ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නය දීර්ඝ කාලයක් පුරා අඛණ්ඩව පැවතීම යි.

සමස්තයක් වශයෙන් ගත් කල අපට පෙනී යන්නේ අප රටේ සිදු කරමින් පැවති හා යථා කාල වකවානුවල දී සිදු කිරීමට අපේක්ෂිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපේකෂිත ඉලක්ක කරා යොමු වීමට නොහැකි වී ඇති බවයි. සේවා වියුක්ති ගැටලුවට නිසි විසඳුමක් සොයා ගැනීමටත් එසේ සොයා ගනු ලැබුවත් යථාර්ථවාදීව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවීමේ ඉඩ හසරට මෙරට පාලක පැලැන්තිය සීමා මායිම් දමා ඇති බවත් පසක් වේ. ක්‍රියාත්මක වූ හා ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඵලදායි නම් සේවා වියුක්තියට නිසි පිළියම් ඉදිරිපත් විය යුතු යි. පර්යේෂණ දත්ත සටහන් මඟින් සේවා වියුක්තිය කොතරම් සඟවා ඉදිරිපත් කළත් යථාර්ථය එවැනි මටසිළුටු ස්වභාවයක් නොගනී.

## ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රමය

පන්සල කේන්ද්‍රකොට ගනිමින් බෞද්ධ අධ්‍යාපන පදනමක් මත පිහිටා ගොඩ නැගුණු ලාංකේය අධ්‍යාපනය වර්තමාන වන විට රැකියාව සඳහාම පවතින්නක් බවට පත් වී ඇත. ගුරුවරු කේන්ද්‍රීය අධ්‍යාපනයකට පාසල තුළ ඉගෙන ගන්නා ශිෂ්‍යාට වැඩ ලෝකයට පිවිසීමේ දී නිවැරදි වෘත්තියන්ට ඉලක්ක වීමේ ප්‍රතිගාමීත්වයක් වර්තමානය වන විට දක්නට ලැබේ. විශේෂයෙන් ම අප ආර්ථිකය තුළ විරැකියා මට්ටමක් දැඩි ලෙස දක්නට ලැබෙන්නේ මේ නිසාවෙනි. එනම් පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දැඩිව දේශපාලනීකරණයට නතු වී ඇත. ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමට පෙර හා පසු කාලය තුළ මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල පිහිටුවමින් ආරම්භ කර අද වන විට පෞද්ගලික පාසල් ව්‍යාප්ත වීම දක්වා පාසල් අධ්‍යාපන පද්ධතිය විශාල වී ඇති බවයි. නමුත් පාසල් තුළ ක්‍රියාත්මක වන පාසල් විෂයය මාලාවන්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපේ රටේ ආර්ථිකමය වශයෙන් කොතරම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගන්නේ දැයි පරස්පරතාවක් තිබේ. අධ්‍යාපනය ලද විරැකියා පිරිස වැඩි වෙමින් පවතී.

මෙරට අධ්‍යාපන ක්‍රමය එය එසේ සිදු නොවීම නිසා ආර්ථිකයට අවශ්‍ය යෙදවුම් හා අධ්‍යාපනයේ නිමවුම් අතර පරස්පරතාවක් දක්නට ලැබේ. එහි ප්‍රතිඵලය වන්නේ රටේ සංවර්ධනයට අවශ්‍යය පුහුණු වෘත්තිකයන්ගේ හා ශිල්පීයන්ගේ හිඟයක් පැවතීමයි. අනෙක් අතට පාසල් අධ්‍යාපනය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අධ්‍යාපන සහතික පමණක් ගත් රැකියා විරහිත විශාල පිරිසක් රැකියා අපේක්ෂාවෙන් සිටීමයි. අද වන විට අප ආර්ථිකය තුළ මෙය ජාතික ප්‍රශ්නයක් තරමට වර්ධනය වී හමාරය. මෙතෙක් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන අරමුණු හා පාසල් විෂය මාලාවන්ගේ අඩුපාඩුකම් නිසා විශාල වශයෙන් සේවා වියුක්තිය උද්ගත වී ඇත. අප රටේ ශිෂ්‍යය ජනගහනයෙන් 2% ක් තරම් වූ පිරිසක් අරමුණු කරගෙන අධ්‍යාපන ක්‍රමය සැකසී ඇත. සීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයට ගැළපෙන අයුරින් රටේ අධ්‍යාපන ක්‍රමයේ ගැළපීම් ප්‍රමාණවත් ලෙස සිදු වී නැත.

රාජ්‍යය ප්‍රතිපත්ති දෙස බැලීමේ දී සේවා වියුක්තිය පහළ මට්ටමක රඳවා ගැනීමට පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් තවමත් සංවේදී ලෙස පොදු ආර්ථිකය සඳහා හඳුන්වා දීමට පොහොසත් වී නැත. විශේෂයෙන් ම අප රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමාජයේ පැවැත්ම හා පෝෂණයට උර දෙන අධ්‍යාපන ක්‍රමයක් ගොඩ නගා ගැනීමට ඇති වී තිබේ ද යන ප්‍රශ්නය පැන නඟී. පාසල් විෂයය මාලාව රටේ සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍යය ශිල්පීය කුසලතා, නිමවුම් හැකියාවන් හා දැනුම සම්පූර්ණ වශයෙන් ලබා දීමට තරම් පොහොසත් වී නැත. පාසල් විෂයය මාලා රටක තිබෙන සම්පත් හා කාලීන සංස්කෘතික ප්‍රවණතාවලට අනුකූලව සිසුන්ගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා ඉටු විය යුතු ය යනුවෙන් "ඩේවිඩ් වොරිවික්" අධ්‍යාපනඥයා ප්‍රකාශ කර ඇත. ඉන් පෙනී යන්නේ රටක ඇති භෞතික සම්පත්වලින් උපරිම ඵල නෙළා ගැනීමට නම් මානව ප්‍රාග්ධනයේ ඵලදායීතාව ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරීමට සමත් පාසල් විෂයය මාලාවක් තිබිය යුතු බවයි.

සංවර්ධිත රටවල මට්ටමට අපේ අධ්‍යාපනය දියුණු වී නැතත් සාක්ෂරතා අනුපාතය, 92.4% අතින් ශ්‍රී ලංකාව ඉහළ මට්ටමක සිටී (මහ බැංකු වාර්තාව, 2014). එහෙත් ලංකාවේ සාක්ෂරතා අනුපාතය වර්ධනය වීමත් සමඟ කාර්ය බද්ධ උගත්කම වර්ධනය වී ඇත්තේ අල්ප වශයෙනි. එය ද්විතියික අධ්‍යාපනයේ ඉහළ මට්ටමක පවතී. මෑතකාලීනව හඳුන්වා

දුන් ප්‍රතිසංස්කරණ කාර්ය බද්ධ උගත්කම වැඩි කිරීම අරමුණු කරගෙන පැවතියත් ආර්ථික වර්ධනය හා සංවර්ධනයට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආසක්ත වීම තව දුරටත් සිදු විය යුතු යි. ඒ සඳහා,

1. අධ්‍යාපන කුසලතා හා ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා අතර සබඳතාව තහවුරු වනුයේ අධ්‍යාපන පාඨමාලා කර්මාන්ත හා සම්බන්ධ කළ යුතු ය.

2. එක් සුවිශේෂී රැකියාවක් සඳහා පුහුණු කිරීම වෙනුවට අධ්‍යාපනයෙන් පසු ඕනෑම රැකියාවක් කළ හැකි පරිදි "මාරු කළ හැකි කුසලතා ලබා දිය යුතු ය".

3. රාජ්‍යය අංශයේ අධ්‍යාපනික සේවා සඳහා ඇති පීඩනය අඩු කිරීමට පෞද්ගලික අංශය ද යොදවා ගත හැකි පරිදි නීතිමය වෙනස්කම් ඇති කළ යුතු ය.

## ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ප්‍රථමවරට ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දීම සිදු වූයේ 1971 ඇති වූ උගත් පිරිසගේ තරුණ කැරැල්ල මගින් ඇති කළ බලපෑමත් සමඟ ය. ඒ හරහා 1972 දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ප්‍රථමවරට හඳුන්වා දෙන ලදී. එහි දී මූලික වශයෙන් අවධානය යොමු කළේ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය කෙරෙහි ය. නමුත් මේ කාලවකවානුව තුළ හඳුනාගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් රැකියා විරහිතභාවයට නිසි පිළියම් ලබා ගැනීමට නොහැකි විය. එකල අ.පො.ස (සා.පෙළ) සමත් පිරිසෙන් 39.37% (උ.පෙළ) සමත් පිරිසෙන් 9.2% රැකියා වියුක්තව සිටියේ ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013).

එකී පැවති අඩු ලුහුඬුතා සපුරාලීමට විශේෂයෙන් ව්‍යුහාත්මක සේවා වියුක්තියක් පැවතීම නිසා පෞද්ගලික අංශය වෙත සේවා නියුක්ත කරවීම කෙරෙහි වැඩි අවධානය යොමු කරවමින් ඉංග්‍රිසි අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරවමින් 1981 දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදු කළේ ය (Raheem & Gunesekara, 1994). මේ තුළින් ද සේවා වියුක්තිභාවයට පිළියම් සෙවීමට නොහැකි විය. 1990 වන විට අ.පො.ස. (සා.පෙළ) හා (උ.පෙළ) සමත් නමුත් සේවා වියුක්තව පවතින ප්‍රතිශතය පිළිවෙළින් 26.5% හා 15.4% මට්ටමකට දිව ගියේ ය. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස ඉංග්‍රිසි අධ්‍යාපන ක්‍රමවේදය ලාංකේය පාසල් අධ්‍යාපන ක්‍රමවේදයට හඳුන්වා දෙන ලදී. මෙහි මූලිකම අභිප්‍රාය වූයේ ඉංග්‍රීසි භාෂා ප්‍රවණතාව වර්ධනය කරමින් පෞද්ගලිකකරණය වෙමින් යන රැකියා ක්ෂේත්‍රයන්ට උගත් තරුණ පිරිස යොමු කිරීමේ අවකාශ ලබා ගැනීමයි. අධ්‍යාපනය සඳහා මෙලෙස ඉදිරිපත් කරන ලද ප්‍රතිසංස්කරණයන් තුළින් ද 1990 දී 15.9% ක් පැවති සේවා වියුක්තිය 1999 දී 8.9% දක්වා පහත වැටුණි. නමුත් 2000 සේවා වියුක්තිය 7.7% ක් විය. 2000 වසරේ දී සේවා වියුක්තිය වඩාත් ඉහළ මට්ටමක පැවතියේ අවුරුදු 20 - 29 අතර කාණ්ඩය තුළ වූ අතර අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් ඇති පුද්ගලයන් අතර සේවා වියුක්තිය 2000 වසරේ මුල් කාර්තුව තුළ දී 14.6% ක් විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2000).

2001 වසරේ දී ක්‍රියාත්මක වෙමින් පැවති අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි ඵලදායීතාවය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ නියාමන ඒකකයක් පිහිටුවන ලදී. තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා 2001 දී

පරිගණක ඉගැන්වීමේ මධ්‍යස්ථාන 1000 ක් හා බහුවිධ මාධ්‍යය කුටි 2400 ක් පාසල්වල ස්ථාපනය කරන ලදී. විෂයමාලා ප්‍රතිසංස්කරණ, පාඨමාලා ඒකක, නව ඉගැන්වීමේ ක්‍රම හඳුන්වා දීම, කාර්ය මණ්ඩල සංවර්ධන වෘත්තීය මාර්ගෝපදේශකත්වය අධ්‍යාපන හා පර්යේෂණ කාර්යමණ්ඩල පුහුණුව සහ උපදේශනය යනාදිය යෝජිත ප්‍රධාන ප්‍රතිසංස්කරණවලට ඇතුළත් විය. නමුත් 2001 වර්ෂයේ දී සේවා වියුක්තිය 7.8% දක්වා වැඩි විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2001). රට තුළ ආයෝජන අඩු වීම හා ශ්‍රම ඉල්ලුම පහත වැටීම එයට හේතු විය.

2010 වර්ෂයේ දී ''ඉසුරු පාසල් ව්‍යාපෘතිය'' යටතේ ද්විතීක පාසල් 1000 වැඩසටහන, සැමට ඉංග්‍රිසි යන වැඩසටහන, ''අධ්‍යාපනයේ හවුල්කරුවෝ'' සහ "Intel World Ahead"යන වැඩසටහන් මෙම කාලය තුළ ක්‍රියාත්මක විය. මෙම අධ්‍යාපන සංවර්ධනවල ඵලදායීතාවය පෙන්නුම් කරනු වස් 2010 වර්ෂයේ පැවැති 4.9% ක් වූ සේවා වියුක්ති අනුපාතය 2011 වසරේ දී 4.2% දක්වා අඩු විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011). අධ්‍යාපන මට්ටම් අනුව සේවා වියුක්තිය ගණනය කිරීමේ දී පෙර වසරවල පැවති අ.පො.ස. (උ.පෙළ) හා ඉහළ සුදුසුකම් සහිත කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතය අඩු වීමක් දක්නට ලැබේ. 2013 වසරේ පැවති 8.6% සිට 2014 වෂරේ දී 8.1% දක්වා අ.පො.ස. (උ.පෙළ) සේවා වියුක්තිකයන්ගේ අඩු වීම තුළින් පැහැදිළි වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

මෙතෙක් සිදු කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ ඵලදායී ශ්‍රම සැපයුම අපේක්ෂිත ලෙස හැඩ ගස්වා ගැනීමට එතරම්ම සමත් වි නොමැති වී ආකාරය පහත රූප සටහන මඟින් අවබෝධ කර ගත හැකි ය. මෙම රූප සටහන තුළ නිරූපණය වනුයේ 2012 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ පවතින සේවා වියුක්ති මට්ටම වේ. 2012 වසර තුළ විරැකියා අනුපාතය 4.1 ක් දැක ගත හැකි වේ. 2013, 2014 වසරවල විරැකියා අනුපාතය ක්‍රමක් ක්‍රමයෙන් අඩු වැඩි වී ඇති ආකාරය දැතක ගත හැකි වේ. එම ප්‍රමාණය පිළිවෙලින් 3.9, 4.6, 4.4, 4.1, 4.5, 4.2 ප්‍රමාණයක් ගනු ලබයි. වර්තමානය වන විට 2015 වසර තුළ දී සේවා වියුක්ති අනුපාතයේ වැඩි වීමක් දැක ගත හැකි වේ. 2015 වසර මුල් සමයෙහි එනම් ජනවාරි මස තුළ සේවා වියුක්ති අනුපාතය 4.4 සිට 4.7 දක්වා ඉහළ අගයක් නිරූපණය කරනු දැක ගත හැකි වේ. 2015 වසර මැද භාගය වන විට එනම් ජූලි මාසයේ මෙම අගය සියයට 4.5 දක්වා අඩු වී ඇත. නමුත් අනෙකුත් වසරවලට සාපේක්ෂව මෙම අගය වර්ධනය වී ඇති බව පෙනේ. අධ්‍යාපන ප්‍රතිසංස්තරණයන්හි වෙනස්කම් තුළින් සේවා වියුක්ති අනුපාතය අඩු කර ගැනීමට අසමත් වී ඇත.

වගු අංක - 01 ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය

සේවා

වියුක්ති

අනුපාතය




වර්ෂ

මූලාශ්‍රයඃ www.tradingeconomics.com, 2015.

ඉහත රූප සටහන මගින් පැහැදිලි වන්නේ ආර්ථිකය තුළ සැලකිය යුතු මට්ටමක සේවා වියුක්තියක් පවතින බවයි. මේ නිසා ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනය ලද පිරිසට ප්‍රමාණවත් රැකියා ප්‍රමාණයක් සොයා ගැනීමේ ගැටලුක් පවතී. නිවැරදි අධ්‍යයන ක්‍රමවේදයක් පාසල් අධ්‍යාපනය තුළින් මූලිකව ම නොලැබීම හේතුවෙන් ආර්ථිකයේ සංවර්ධනයට යොදවන විශාල මූල්‍ය හා මූර්ත ප්‍රාග්ධනයන් අපතේ යයි. ශිෂ්‍යය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලැබිය යුත්තේ ඒ නිසා ය. සමාජයේ ඉල්ලුමට සමානවන පරිදි ශ්‍රමික පිරිසක් බිහිකිරීමට අවශ්‍යය දැනුම හා කුසලතාවන් ජනිත කරන ප්‍රතිසංස්කරණ මාලාවක් හඳුන්වාදීම විනා ගතානුගතික සම්ප්‍රදායික අධ්‍යාපනයේ නිෂ්ටාවන් ඉවත් කළ යුතු වේ. එයයි පාසල් අධ්‍යාපනයේ සැබෑ අධ්‍යාසය ලෙස සලකනුයේ. එය ඉටු කිරිම එතරම් පහසු කටයුත්තක් නොවූවත් අනෙකුත් රටවල්වල ප්‍රතිසංස්කරණ සමඟ තුලනය කර අප සිටින්නේ කවර ස්ථානයක දැයි හොඳින් අවබෝධකර ගත හැකි වේ.

එංගලන්තයේ අධ්‍යාපනය ක්‍රමවේදයේ අනිවාර්ය අධ්‍යයන කාල සීමාව අවුඃ 11 කි. ද්විතීක අධ්‍යාපනය මූලිකවම ඉලක්ක වන්නේ කර්මාන්ත සමඟ යි. ජන විඥානයට ඔබින විද්‍යාව හා තාක්ෂණික ඥානයෙන් හෙබි කුසලතාවන් නිර්මාණයන්ට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හැඩ ගස්සවා ඇත. ඇමරිකානු අධ්‍යාපන ආයතන මූලික, ද්විතික හා පශ්චාත් ද්විතික වශයෙනුත් අවිධිමත් හා අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලබයි. ශාස්ත්‍රිය දැනුම මෙන් ම වෘත්තිය අධ්‍යාපන දැනුම මේ හරහා ලබාදෙයි. චීනයේ නව නිර්මාණයන් ඇති කිරීමට අවශ්‍යය නූතන තාක්ණික දැනුම ඇති සමාජවාදී නූතන කාර්මික සමාජයක් බිහි කිරීම හා අන්තර්ජාතික සහ විප්ලවීය සිතුම් පැතුම්වලින් යුක්ත ජනතාවක් බිහිකිරීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණ යි.

**සමාලෝචනය**

ලංකාවේ පාසල් විෂය මාලාව යටතේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරවිය හැකි ශ්‍රම පිරිස නිර්මාණය වීම නොතිබීමත් සංවර්ධනයට අවශ්‍ය වෘත්තිය ගැළපිමක් ප්‍රතිසංස්කරණය හරහා සිදු වී නොමැති බව දක්නට ලැබේ. සම්පත් බෙදී යාමේ

විසමතාවක් පවතින නිසා මානව සම්පතේ ගුණාත්මක භාවයේ ද ගැටලු පවතී. විශේෂයෙන් මෙරට පාසල් විෂය මාලාව ජන ජීවිතයට නොගැළපේ ය යන විශ්වාසයෙන් කටයුතු කරන නිසා කළුකඩ ආර්ථික ක්‍රියාවන්ට නිරතවීමේ නැඹුරුතාවයක් මේ හරහා ගොඩ නැගේ. ජාත්‍යන්තර සංවර්ධන ආයතනය, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතනයන්ගෙන් මූලික අධ්‍යාපනය සඳහා විශාල වශයෙන් ආධාර සැපයුවත් ඉන් ජනිතවන ශ්‍රම සැපයුම ආර්ථිකයේ නිමවුමක් ලෙස යොදා ගැනීමේ ගැටලුවක් පවතී. ශ්‍රමය නැවත පුහුණු කරනවානම් ඒ සඳහා අමතර වියදමක් දැරිය යුතුය. සාක්ෂරතාවය අතින් අප කොතරම් පොහොසත් වුවත් කාර්යබද්ධ උගත්කම කෙරෙහි අවධානය යොමු කර නැත.

විෂයමාලාවන් පොදු සිද්ධාන්තමය වශයෙන් හා ව්‍යවහරික විද්‍යාවන් කෙරෙහි අවධානය යොමු වන අධ්‍යයන ක්‍රමවේදයන් ඇතුළත් වන ලෙස නම්‍යය වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලද ශ්‍රමික පිරිසක් නිර්මාණය වන පරිදි විෂයය මාලාවක් ඇතුළත් කළ යුතු ය. ආර්ථිකයේ ප්‍රබල ආයතනයක් වන පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන්ට ද ගැළපෙන ආකාරයේ පාසල් දරුවන්ට රැකියා අවස්ථා ජනිත කළ හැකි හඳුනා ගත් කොටස් විෂයය මාලාවන්ට ඇතුළත් කිරීම වටී. තාක්ෂණික අවශ්‍යතා හැඩ ගැස්විය යුතු ය. ශාස්ත්‍රීයත් හා වෘත්තීය යන දෙඅංශයම සම්බන්ධතාවන්ගේ පාඨමාලාවක් සැකසීම, බහුවිධ දක්ෂතා මාරුකළ හැකි කුසලතාවන් ලබා දීම, නෛතික ව්‍යුහයන් බලාත්මක කිරීම, වෘත්තීය අධ්‍යාපන පනත් සකස් කිරීම, ක්‍රමවත් විභාග රටාවක් සකස් කිරීම,කාර්මික විද්‍යාල ආයතන විධිමත් කිරීම සිදු කළ යුතු ය.

සමස්තයක් වශයෙන් ගත් විට අපට අවසානයෙන් කිව හැකි පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ගේ බෙලහීනතාවය නිසා මුහුණ දීමට සිදු වී ඇති මූලික ආර්ථික ප්‍රශ්නයක් වන සේවා වියුක්තියට නිසි විසඳුම් සැපයීමට තවමත් අප අවධානය යොමු නොකළහොත් සංවර්ධනය වීම සුභ සිහිනයක් ම වනු නිසා ශාස්ත්‍රීය අධ්‍යාපනය මෙන්ම වෘත්තීය අධ්‍යාපනය මිශ්‍ර වන පරිදි වැඩ ලෝකයට ගැළපෙන ශ්‍රමික පිරිසක් බිහි කිරීමට අවැසි පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළියෙල කිරීමේ අවධානය වත්මන් අධ්‍යාපන බලධාරීන් යොමු වීම සිදු කළ යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරතුංග, සී.ජේ. සහ සමරජීව, ආර්. (2012), *"අපට ගැළපෙන ආර්ථික ක්‍රමවේද"*, රාවය පබ්ලිෂර්ස්, මහරගම.

ආරච්චි, එම්.කේ. (2009), *"අධ්‍යාපන සංවාද"*, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.

පෙරේරා, ආර්.සී. (1999), *"අධ්‍යාපනය හා පුහුණුව"*, අධ්‍යාපන සංවර්ධනය සඳහා විකල්ප මාර්ග, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.

බ්‍රදනර්, ජේ.එස්. (1975), *"අධ්‍යාපන ක්‍රියාවලිය"*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කොළඹ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය (1969), අධ්‍යාපන හා සංස්කෘතික මධ්‍යස්ථානය.

හෙට්ටිආරච්චි, කේ. (2002) *"අධ්‍යාපනය හා ජාතිය ගොඩනැගීම"*, එස්. ගොඩගේ සහෝදරයෝ , කොළඹ 10.

Garrouste C. & KoZovska K. & Perez A. (2010), *"Education and long - term unemployment"*, European Union.